# ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
# අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය - 2020 අගෝස්තු
# නව හා පැරණි නිර්දේශය

මෙම විභාගය නව නිර්දේශය හා පැරණි නිර්දේශය වශයෙන් විභාග දෙකක් ලෙස පවත්වනු ලැබේ. අයදුම්පත් සම්පූර්ණ කිරීමේ දී තමන් ඉදිරිපත්වන විෂය නිර්දේශය කුමක් ද යන්න නිශ්චිතව හඳුනාගෙන ඒ අනුව අයදුම්පත් සම්පූර්ණ කොට ඉදිරිපත් කළ යුතු ය. **මෙවර විභාගයේදී සෑම විභාග අපේක්ෂකයකුම අයදුම්පත් ඉදිරිපත් කළ යුත්තේ මාර්ගගත (online) ක්‍රමය මගිනි.** එහි මුද්‍රිත පිටපතද තැපැල් මගින් එවීම අනිවාර්ය බව කරුණාවෙන් සලකන්න. අයදුම්පත සම්පූර්ණ කිරීම සඳහා උපදෙස් වෙබ් අඩවියේ සඳහන් කර ඇත.

උක්ත විභාගයට පෞද්ගලිකව පෙනී සිටීම සඳහා වන අයදුම්පත් 2020 පෙබරවාරි 12 වන දින සිට මාර්තු 02 වන දින තෙක් භාරගනු ලැබේ. සෑම පෞද්ගලික අයදුම්කරුවකු ම මෙම නිවේදනය සම්පූර්ණයෙන් ම හොඳින් කියවා අවබෝධ කර ගෙන තම අයදුම්පත මාර්ගගත ක්‍රමයට (online) පිවිස සම්පූර්ණ කොට ඉදිරිපත් කළ යුතු ය. අයදුම්පත්‍රයේ විභාගයට පෙනී සිටීමට තෝරා ගත් **නගරය හා විෂයයන්** ඇතුළත් කිරීමේ දී නිවැරදිව ම ඇතුළත් කිරීමට විශේෂයෙන් සැළකිලිමත් විය යුතු ය. උපරිම වශයෙන් ප්‍රධාන විෂයන් 03 ක් සඳහා පෙනී සිටීමට අයදුම්කරුවන්ට ඉඩ දෙනු ලැබේ.

## 02. අයදුම්පත් :

**උපදෙස් පරිදි මාර්ගගත (online) ආකාරයට අයදුම්පත සම්පූර්ණ කර ඉදිරිපත් කිරීමෙන් අනතුරුව මුද්‍රිත පිටපතක් ලබා ගන්න. මුද්‍රිත පිටපතේ ඔබගේ අත්සන හා ඔබ අයත් කොට්ඨාසයේ ග්‍රාම නිලධාරිගේ අත්සන සහිතව විභාග දෙපාර්තමේන්තුවට යොමු කළ යුතුය. එම පිටපත විභාග දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් නොකරන ලද අයදුම්කරුවන්ට විභාගය සඳහා පෙනී සිටීමට ඉඩ දෙනු නොලැබේ.**

| |
|---|
| **පෞද්ගලික අයදුම්කරුවන් ලෙස විභාගය ඉල්ලුම් කළ හැක්කේ පාසලෙන් අස්වීම් සහතිකය ලබා ඇති අයදුම්කරුවන්ට පමණි. පාසලේ ඉගෙන ගනිමින් ම පෞද්ගලික අයදුම්කරුවන් ලෙස විභාගයට අයදුම් කිරීම සපුරා තහනම් වේ. එසේ පෙනී සිටීමක් අනාවරණය වුවහොත් විභාග ප්‍රතිඵල අවලංගු කොට ඉදිරි විභාග සඳහා පෙනී සිටීම ද තහනම් කරනු ලැබේ.** |

2.1 **පද්ධතියට ප්‍රවේශ වීම**

i) අයදුම්පත සම්පූර්ණ කිරීම සඳහා ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ "www.doenets.lk" නිල වෙබ් අඩවියට පිවිසෙන්න.

ii) Online Applications අයිකනය (tile) තෝරන්න (click).

iii) G.C.E. A/L 2020 - Application for Student Registration (Private) අයිකනය තේරීම මගින් පෞද්ගලික අයදුම්කරුවන්ට විභාගයට ඉල්ලුම් කිරීමට හැකි වේ.

iv) ඔබගේ පෞද්ගලික තොරතුරු, මාධ්‍යය, විභාගයට පෙනී සිටින නගරය, විෂය නිර්දේශය ඇතුල් කිරීමෙන් හා තේරීමෙන් පසුව ඔබ පෙනී සිටීමට බලාපොරොත්තු වන විෂයයන් ඇතුළත් කළ හැකි වේ.

2.2 (අ) **(13) සාමාන්‍ය ඉංග්‍රීසි විෂය :**

ප්‍රධාන විෂයන් තුන සහ සාමාන්‍ය පොදු පරීක්ෂණයට අමතරව අයදුම්කරුවන්ට සාමාන්‍ය ඉංග්‍රීසි විෂය සඳහා ද ඉල්ලුම් කළ හැකි ය. **මේ සඳහා ලබාගන්නා ප්‍රතිඵලය විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා උපයෝගී කරගනු නොලැබේ.** මෙම විෂය සඳහා ලබාගන්නා ශ්‍රේණිය අ.පො.ස.(උ.පෙළ) සහතිකයේ ඇතුළත් කෙරෙන අතර මෙම විෂය තනි විෂයක් වශයෙන් වුව ද අයදුම් කිරීමට ඉඩ දෙනු ලැබේ.

(ආ) **(12) සාමාන්‍ය පොදු පරීක්ෂණය :**

යම් අයදුම්කරුවකු ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල ප්‍රවේශය අපේක්ෂා කරන්නේ නම් ඔහු/ඇය මෙම විෂයයට පෙනී සිට අනිවාර්යයෙන් ම සමත් විය යුතු ය.

U.U.A.6.3.2016.AL Paper AD

(ඇ) **ප්‍රායෝගික පරීක්ෂණ සහිත විෂයයන් ඃ**

විෂය අංක 28, 52, 53, 54, 55, 56, 57, 58, 59, 65 හා 66 යන විෂයයන් සඳහා ලිඛිත පරීක්ෂණයන්ට ඉදිරිපත් වන සියලු ම අයදුම්කරුවන් ප්‍රායෝගික පරීක්ෂණයට කැඳවනු ලැබේ. ලිඛිත සහ ප්‍රායෝගික යන කොටස් දෙකට ම ඉදිරිපත් වන අපේක්ෂකයින්ට පමණක් උක්ත විෂයන්වල ප්‍රතිඵල නිකුත් කරනු ඇත.

ප්‍රායෝගික පරීක්ෂණය සඳහා අයදුම්කරුවන් වෙත ලබා දෙන ප්‍රවේශ පත්‍රයේ සඳහන් දිනයේදී ම ප්‍රායෝගික පරීක්ෂණයට පෙනී සිටිය යුතු ය. එම දිනයේදී ඉදිරිපත් වීමට නොහැකි වූ අයදුම්කරුවන්ට වෙනත් අවස්ථාවකදී ප්‍රායෝගික පරීක්ෂණයට පෙනී සිටීමට ඉඩ දෙනු නොලැබේ.

2.3 2020.03.02 වැනි දිනෙන් පසුව මෙම විභාගය සඳහා අයදුම් කළ නොහැක. විභාග අයදුම්කරුවන් අයදුම්පත සම්පූර්ණ කිරීමෙන් පසු සෙ.මී. 28 x සෙ.මී. 21 (A4) ප්‍රමාණයේ සුදු කඩදාසියක දෙපැත්තට සිටිනසේ අයදුම්පත මුද්‍රණය කරගත යුතුයි. **අයදුම්පත් 2020.03.02 වැනි දින හෝ ඊට පෙර හෝ ලැබෙන සේ විභාග කොමසාරිස් ජනරාල්, තැ.පෙ. 1503, කොළඹ** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. නියමිත දිනට පසුව තැපැල් කරන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

2.4 **එක් අයදුම්කරුවකු විසින් ඉදිරිපත් කළ යුත්තේ එක් අයදුම්පතක් පමණි. අයදුම්පත්‍ර එකකට වඩා ඉදිරිපත් කරන අවස්ථාවල දී සියලු ම අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලබන අතර, එම අයදුම්කරුවන් සම්බන්ධයෙන් නීත්‍යානුකූල පියවර ගනු ලැබේ. විභාග ප්‍රතිඵල නිකුත් කිරීමෙන් පසු වුව ද මෙවැනි වංචනික ක්‍රියාවක් ඔප්පු වුවහොත් විභාග ප්‍රතිඵල අවලංගු කර අදාළ නීත්‍යානුකූල පියවර ක්‍රියාත්මක කරනු ලැබේ.**

03. **විභාග ගාස්තු ගෙවීම ඃ**

විභාග ගාස්තු ගෙවීම තැපැල් කාර්යාල මගින් හෝ බැංකු කාඩ්පත් මගින් (online payment) මගින් සිදුකළ යුතුය.

3.1. තැපැල් කාර්යාල මගින් ගෙවීම් සිදු කරන්නේ නම් "Payment method" යටතේ ඇති "pay by post" අයිකනය තෝරා ගත යුතුය. විභාග ගාස්තු ගෙවිය යුත්තේ **මුද්දරවලින්** හෝ **මුදල් ඇණවුම්**වලින් නොවේ. විභාග ගාස්තුව වශයෙන් නියමිත මුදල ළඟම ඇති ඕනෑම තැපැල්/උප තැපැල් කාර්යාලයකට ගෙවා කුවිතාන්සියක් ලබාගත යුතුය.

ලබාගත් කුවිතාන්සිය මුද්‍රණය කර ගත් අයදුම්පතේ අංක 14 යටතේ ඇලවිය යුතුයි. 2020 පෙබරවාරි 12 වැනි දින සිට 2020 මාර්තු 02 වන දින තෙක් දිවයිනේ සියලු ම තැපැල්/උප තැපැල් කාර්යාලවල මෙම කුවිතාන්සි නිකුත් කිරීම සඳහා විධිවිධාන යොදා ඇත.

3.2 බැංකු කාඩ්පත් (Credit/debit cards) මඟින් ගෙවීම සඳහා "Payment method" යටතේ ඇති "pay by credit/ debit card" අයිතමය තෝරා ගත යුතුය.

| විෂය ගණන | 1 | 2 | 3 | 4 | 5 |
|---|---|---|---|---|---|
| ගාස්තුව රුපියල් | 150/- | 200/- | 250/- | 350/- | 400/- |

අවසාන දිනට පෙර විභාග ගාස්තු ගෙවා තිබුණ ද අවසන් දිනයෙන් පසු එවනු ලබන අයදුම්පත් ප්‍රතික්ෂේප කිරීමට සිදුවන බව වැඩිදුරටත් දන්වමි.

04. එක් ලියුම් කවරයක් තුළ බහා එවිය හැක්කේ එක් අයදුම්පතක් පමණි. **අයදුම්පත බහා එවන කවරයේ වම්පස උඩ කෙළවරේ "අ.පො.ස.(උ.පෙළ) විභාගය - 2020 අගෝස්තු - නගර අංකය ............ හා නගරය ..............."** යනුවෙන් සඳහන් කළ යුතු ය. නගර අංකය සහ නගරය මෙම තිත් ඉරමත පැහැදිලිව සඳහන් කළ යුතු ය. යම් නගරයක විභාග මධ්‍යස්ථානයක් පිහිටු වීමට ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් නොසිටියහොත් ආසන්න නගරයකට යොමු කිරීමට සිදුවේ.

U.U.A.6.3.2016.AL Paper AD

05. ඔබ තෝරා ගන්නා විෂයන්වල **විෂය අංක** හා තෝරා ගන්නා නගරයෙහි **නගර අංකය** ඉතා වැදගත් වේ. **එබැවින් අයදුම්පතේ මුද්‍රිත පිටපත තැපැල් කිරීමට පෙර විශේෂ අවධානයකින් එය නැවත වරක් කියවා එහි ඇතුළත් වී ඇති විෂය අංක, නගර අංකය සහ තොරතුරු නිවැරදි දැයි පරීක්ෂා කර බැලිය යුතු අතර, තවත් අයකු ලවා පරීක්ෂා කරවීම ද ඉතා වැදගත් වේ.**

06. ඔබ ඉදිරිපත් කරන අයදුම්පතෙහි සඳහන් තොරතුරු හා විභාගයට පෙනී සිටීමට ඔබට ලැබෙන ප්‍රවේශ පත්‍රය සම්බන්ධ ව කිසියම් විමසීමක් කරන්නේ නම් ඔබගේ විභාග ප්‍රවේශ පත්‍රය ලැබුණු වහා ම එම ප්‍රවේශ පත්‍රය ද රැගෙන විභාග දෙපාර්තමේන්තුවේ පාසල් විභාග සංවිධාන හා ප්‍රතිඵල ශාඛාව වෙත පැමිණිය යුතු ය.

07. **සෑම පෞද්ගලික අයදුම්කරුවෙක්ම තමාගේ ස්ථිර පදිංචි ලිපිනය ලිවිය යුතු අතර අධ්‍යාපනය ලබන පෞද්ගලික හෝ ජාත්‍යන්තර පාසලේ නම සහ ලිපිනය ඇතුළත් නොකළ යුතු ය. ඔවුන් තම පෞද්ගලික දුරකථන අංකය ද ඇතුළත් කළ යුතු ය.**

08. **අනන්‍යතාව ඔප්පු කිරීම**

විභාග ශාලාවේදී අයදුම්කරුවන් තම අනන්‍යතාව තහවුරු කිරීම සඳහා ජාතික හැඳුනුම්පත හෝ වලංගු විදේශ ගමන් බලපත්‍රය හෝ වලංගු රියදුරු බලපත්‍රය හෝ ඉදිරිපත් කිරීම අනිවාර්ය වේ. විභාගයට පෙනී සිටින සෑම ප්‍රශ්න පත්‍රයක් සඳහා ම තම අනන්‍යතාව ඔප්පු කළ යුතුයි.

ජාතික හැඳුනුම්පතක් නොමැති අයදුම්කරුවකු වේ නම් ඒ සඳහා ග්‍රාම නිලධාරී මගින් පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ කොමසාරිස් ජනරාල් වෙත අයදුම්පතක් ඉදිරිපත් කර තම ජාතික හැඳුනුම් පත සකස් කර ගත යුතු ය.

09. මෙම විභාගය සඳහා රජයේ පාසල්වලින්, ගාස්තු අයකරන / නොකරන රජය අනුමත පෞද්ගලික පාසල්වලින් සහ අනුමත පිරිවෙන්වලින් පළමු වරට සහ දෙවන වරට ඉදිරිපත් වන අයදුම්කරුවන් හැර අනෙකුත් සියලු ම අයදුම්කරුවන් නියමිත විභාග ගාස්තු ගෙවිය යුතු වේ. එසේ ගාස්තු ගෙවා නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

10. මෙම විභාගය සඳහා අයදුම්කරනු ලබන **විශේෂ අවශ්‍යතා** සහිත අයදුම්කරුවන් වේ නම් candidates with special needs යටතේ තිබෙන තොරතුරු සම්පූර්ණ කිරීම අනිවාර්ය වේ.
**දෘශ්‍යාබාධිත/ශ්‍රවයාබාධිත/වෙනත් විශේෂ අවශ්‍යතා ඇති** අයදුම්කරුවන් වෙනුවෙන් ඉදිරිපත් කරන අයදුම්පතේ වම් පස උඩ කෙළවරෙහි රතු පාටින් **"දෘශ්‍යාබාධිත/ශ්‍රවයාබාධිත/වෙනත් විශේෂ අවශ්‍යතා ඇති අයදුම්කරුවෙකි."** යනුවෙන් සඳහන් කරන්න.

**සටහන : මෙම විභාගය සඳහා** ගෙවන ලද විභාග ගාස්තු සම්පූර්ණයෙන් හෝ අඩක් හෝ ආපසු ගෙවීමක් හෝ වෙනත් විභාගයකට මාරු කිරීමක් හෝ සිදු කරනු නොලැබේ.

මෙම විභාගයට අයදුම් කිරීමෙන් අනතුරුව එක ප්‍රශ්න පත්‍රයකට හෝ ප්‍රශ්න පත්‍රයක කොටසකට හෝ පෙනී නොසිටි අපේක්ෂකයින් පමණක් විභාගයට පෙනී නොසිටි අපේක්ෂකයින් සේ සලකනු ලැබේ. එවැනි අපේක්ෂකයන්ගේ විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා බලපාන විභාග වාරය අවලංගු නොවන බැවින්, ඒ සඳහා වෛද්‍ය සහතික ඉදිරිපත් කිරීම කිසිසේත් ම අවශ්‍ය නොවේ. කිසිදු විෂයකට පෙනී නොසිටි බව ඔප්පු කිරීමට ඇති එක ම සාක්ෂිය වන්නේ තමන් වෙත නිකුත් කර ඇති ප්‍රවේශ පත්‍රය ආරක්ෂා කර තබා ගැනීම පමණි.
**මෙම විභාගය මගින් නව හා පැරණි විෂය නිර්දේශවලට අනුව විශ්වවිද්‍යාල සඳහා සිසුන් තෝරා ගන්නා ක්‍රමවේදය පිළිබඳ ව ඉදිරියේදී විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නිවේදනය කරනු ඇත.**

උක්ත කරුණු සම්බන්ධයෙන් යම් විමසීමක් කළ යුතු නම් පහත සඳහන් දුරකථන අංකවලට අමතන්න.

දුරකථන අංක : 011-2784208 / 011-2784537

ෆැක්ස් අංක : 011-2784422

යොමු අංකය : 6/3/AL/2020
පාසල් විභාග සංවිධාන හා ප්‍රතිඵල ශාඛාව
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
තැ.පෙ. 1503, කොළඹ.
2020.02.13

බී. සනත් පූජිත
විභාග කොමසාරිස් ජනරාල්

U.U.A.6.3.2016.AL Paper AD

## අ.පො.ස.(උ.පෙළ) විභාගය - 2020 අගෝස්තු
## අයදුම්පත් සම්පූර්ණ කිරීම සඳහා විභාග අයදුම්කරුවන්ට උපදෙස්

01. **පද්ධතියට ප්‍රවේශ වීම**

1.1 අයදුම්පත සම්පූර්ණ කිරීම සඳහා ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ www.doenets.lk නිල වෙබ් අඩවියට පිවිසෙන්න.

1.2 Online Application අයිකනය (tile) තෝරන්න (click).

1.3 G.C.E. A/L 2020 - Application for Student Registration (Private) අයිතමය තේරීම මගින් පෞද්ගලික අයදුම්කරුවන්ට විභාගයට ඉල්ලුම් කිරීමට හැකි වේ.

1.4 ඔබගේ පෞද්ගලික තොරතුරු මාධ්‍යය, විභාගයට පෙනී සිටින නගරය, විෂය නිර්දේශය ඇතුල් කිරීමෙන් හා තේරීමෙන් පසුව ඔබ පෙනී සිටීමට බලාපොරොත්තු වන විෂයයන් ඇතුළත් කළ හැකි වේ.

02. **Personal Information**

Details of applicant

2.1 NIC No. : ජාතික හැඳුනුම්පතේ/වලංගු විදේශ ගමන් බලපත්‍රයේ/ වලංගු රියදුරු බලපත්‍රයේ අංකය ඇතුළත් කර එහි ඡායා පිටපතක් මුද්‍රණය කරගත් අයදුම්පතේ අදාළ කොටුවේ අලවන්න. මෙම ජාතික හැඳුනුම්පතෙහි/වලංගු විදේශ ගමන් බලපත්‍රයෙහි/ වලංගු රියදුරු බලපත්‍රයේ ඡායා පිටපත නොමැති අයදුම්කරුවන්ගේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරන බව ද වැඩි දුරටත් දන්වමි.

2.2 Title තෝරන්න. (Rev, Mr, Mrs. Miss)

2.3 Full Name

උප්පැන්න සහතිකය අනුව සම්පූර්ණ නම ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් ඇතුළත් කරන්න. මුලකුරු සමග නම ඇතුළත් නොකරන්න.

**උදාහරණ : KULASOORIYAGE MAHESH SUJITH DE SILVA**

පද්ධතියට ඇතුළත් කිරීමට නොහැකි අකුරු 90කට වඩා වැඩි දිග නමක් ඇත්නම් අයදුම්පතේ මුද්‍රිත පිටපතේ ඉහළින් සම්පූර්ණ නම සටහන් කරන්න.

2.4 Date of Birth

උප්පැන්න සහතිකය අනුව උපන් දිනය ඇතුළත් කිරීම හෝ තේරීම සිදු කරන්න.

2.5 Gender

ස්ත්‍රී/පුරුෂ භාවය දැක්වීම සඳහා පුරුෂ නම් "Male" යන්නද ස්ත්‍රී නම් "Female" යන්නද තෝරන්න.

2.6 පෞද්ගලික දුරකථන අංකය (ජංගම) :

පෞද්ගලික දුරකථන අංකය (ස්ථාවර) :

විද්‍යුත් තැපැල් ලිපිනය ::

2.7 Private Address

ලිපිනය : ස්ථිර ලිපිනය ඉංග්‍රීසි කැපිටල් අකුරින් සඳහන් කරන්න.

**කිසි විටෙකත් තාවකාලික පදිංචි ස්ථානයේ ලිපිනය හෝ පෞද්ගලික/ජාත්‍යන්තර පාසලේ ලිපිනය ඇතුළත් නොකළ යුතුය.**

**ඊළඟ පියවරට යාමට Next අයිකනය භාවිත කරන්න.**

03. **Exam Request**

Additional Details

3.1 Prefered medium of language

පෙනී සිටින භාෂා මාධ්‍යය : පෙනී සිටින භාෂා මාධ්‍යය තෝරන්න. මාධ්‍ය දෙකකින් පෙනී සිටින අවස්ථාවලදී ඉංග්‍රීසි මාධ්‍යට අමතරව තමා පෙනී සිටින මාධ්‍ය ප්‍රධාන මාධ්‍ය ලෙස මෙහිදී තේරිය යුතුය.

3.2 District and Town you wish sit for the examination

තෝරාගත් දිස්ත්‍රික්කය සහ නගරය :

ඔබ විභාගයට පෙනී සිටීමට තෝරාගත් දිස්ත්‍රික්කය සහ නගරය තෝරාගන්න. **වැරදි නගරයක් ඔබ විසින් තේරීමෙන් ඉතා දුර විභාග මධ්‍යස්ථානයක් ලැබීමට ඉඩ ඇත**. අදාළ නගර හා නගර අංක සහිත ලේඛනයක් මේ සමග අමුණා ඇත. ඔබ ඉල්ලා ඇති විභාග මධ්‍යස්ථානය පසුව වෙනස් කිරීමක් සිදු කරනු නොලැබේ.

U.U.A.6.3.2016.AL Paper AD

3.3 Syllabus selected to sit for the examination
විභාගයට අයදුම් කරන විෂය නිර්දේශය තෝරන්න.
New - නව විෂය නිර්දේශය Old - පැරණි විෂය නිර්දේශය

3.4 Number of Examination attempts
ඔබ විභාගයට අයදුම්කරන්නේ කී වෙනි වතාවට දැයි තෝරන්න.

3.5 Special needs applicant (Vision/Hearing/Other ?)
3.5.1 විශේෂ අවශ්‍යතා රහිත නම් **No** යන්න තෝරන්න.

3.5.2 ඔබ යම්කිසි විශේෂ අවශ්‍යතාවන් සහිත අයදුම්කරුවකු නම් Yes යන්න තෝරන්න. ඉන්පසු ලැබෙන පහත තොරතුරු සම්පූර්ණ කරන්න.

- Type of the disability - ආබාධයේ ස්වභාවය
  - Braille - බ්‍රේල් අයදුම්කරුවෙකි.
  - Hearing - ශ්‍රවණාබාධිත අයදුම්කරුවෙකි.
  - Vision - දෘෂ්‍යාබාධිත අයදුම්කරුවෙකි.
  - Body functions/structure - කායික ආබාධ සහිත අයදුම්කරුවෙකි.
  - Other- වෙනත් ආබාධ සහිත අයදුම්කරුවෙකි.
- More details about the disability - ආබාධිත තත්ත්වය පිළිබඳ වෙනත් තොරතුරු
- If special center required select it - විශේෂ මධ්‍යස්ථානයක් අයදුම්කරන්නේ නම් එය තෝරන්න.

**ඊළඟ පියවරට යාමට Next අයිකනය භාවිත කරන්න.**

## 04. Add Subject Information

2020 වසරේදී විභාගයට පෙනී සිටීමට නියමිත විෂයන් හා පෙනී සිටින මාධ්‍යය

4.1 අධ්‍යාපන අමාත්‍යාංශය මගින් නිකුත් කරන ලද 2016/13 හා 2016.04.26 දිනැති චක්‍රලේඛයට අනුකූලව විෂයයන් තෝරා ගත යුතුයි. එම චක්‍රලේඛයේ සම්මත විෂය ධාරාවලට අනුගත නොවන වෙනත් විෂය සංකලනයන් තෝරා ගත් අවස්ථාවලදී අයදුම්කරුවන් " නිශ්චිත විෂය ධාරාවකට අයත් නොවන (Non Stream)" යනුවෙන් හඳුන්වා දෙන අතර එම අයදුම්කරුවන් සඳහා විභාග ප්‍රතිඵල නිකුත් කිරීමේදී දිවයින් තරාව (Island Rank) හා දිස්ත්‍රික් තරාව (District Rank) නිකුත් කරනු නොලැබේ. එම චක්‍රලේඛයට පටහැනිව විෂය සංකලන තෝරා ගැනීමෙන් අයදුම්කරුවන්ට මුහුණ පෑමට සිදු වන දුෂ්කරතා පිළිබඳ ව මෙම දෙපාර්තමේන්තුවට වගකීමක් නොමැති බව කරුණාවෙන් සලකන්න. අයදුම්කරුවන්ට මෙම නිවේදනයේ දක්වා ඇති විෂයය ලේඛනයෙන් තමා පෙනී සිටීමට නියමිත විෂයයන් තෝරා ගත හැකි ය. මෙම විභාගය සඳහා හර විෂයන් තුනක් තෝරා ගත යුතු අතර, **විශ්වවිද්‍යාලයට ඇතුළත් වීමට අදහස් කරනු ලබන්නේ නම් සාමාන්‍ය පොදු පරීක්ෂණයට ද පෙනී සිට සමත් විය යුතුයි.** ඉහත විෂයන්ට අමතරව විෂයය අංක 13 සාමාන්‍ය ඉංග්‍රීසි විෂයට ද ඉල්ලුම් කළ හැකිය.

4.2 අවශ්‍ය නම් ඔබට විභාගය සඳහා භාෂා මාධ්‍ය දෙකකින් පෙනී සිටිය හැක.
- සිංහල හා ඉංග්‍රීසි
- දෙමළ හා ඉංග්‍රීසි

කිසිවිටෙකත් සිංහල හා දෙමළ මාධ්‍යයෙන් එකවර විභාගයට පෙනී සිටිය නොහැක.

4.3 **ඉතා වැදගත් ඃ**

i හෞතීය විද්‍යා විෂය ධාරාව යටතේ 07 ගණිතය විෂයට ඉල්ලුම් කළ නොහැකි ය.

ii විෂය අංක 14, 15, 16, 17, 18 හා 19 යන විෂයයන් අතුරෙන් **එක්** විෂයකට පමණක් ඉල්ලුම් කළ හැකි ය.

iii (65) ඉංජිනේරු තාක්ෂණවේදය හා (66) ජෛව පද්ධති තාක්ෂණවේදය යන විෂයයන් දෙකෙන් ඉල්ලුම් කළ හැක්කේ **එක්** විෂයකට පමණි.

iv (67) තාක්ෂණවේදය සඳහා විද්‍යාව විෂයට ඉල්ලුම් කළ හැක්කේ ඉංජිනේරු තාක්ෂණවේදය විෂය හෝ ජෛව පද්ධති තාක්ෂණවේදය විෂය හෝ ඉල්ලුම් කරන්නේ නම් පමණි.

v ආගම් හා ශිෂ්ටාචාර විෂයන් අතුරෙන් යම් ආගමක් තෝරා ගන්නේ නම් ඊට අදාළ ශිෂ්ටාචාර විෂය තෝරා ගත නොහැකි ය. එසේම ශිෂ්ටාචාර විෂයන් තෝරා ගන්නේ නම් ඊට අදාළ ආගම විෂය තෝරා ගත නොහැකි ය.

vi 52 නර්තනය විෂය ඉල්ලුම් කිරීමේදී ඔබ ඉගෙනුම ලැබූ නර්තන වර්ගය තෝරන්න.
**මෙම වෙන් කර ගැනීම ප්‍රායෝගික පරීක්ෂණවලට පමණක් අදාළ වේ.**

vii 54 - පෙරදිග සංගීත විෂය ඉල්ලුම් කළ හැක්කේ සිංහල මාධ්‍යයෙන් පමණි.

viii අයදුම් පත්‍රයේ සඳහන් කරන ලද විෂයන් පසුව වෙනස් කිරීමට හෝ විභාග ශාලාවේ දී විෂයන් මාරු කිරීමට හෝ අමතර විෂයන්ට පෙනී සිටීමට හෝ ඉඩ දෙනු නොලැබේ. යම් හෙයකින් එසේ පෙනී සිටියහොත් එම අයදුම්කරුගේ ප්‍රතිඵල අවලංගු කිරීමට සිදුවනු ඇත.

U.U.A.6.3.2016.AL Paper AD

4.4 **Common General Test**
සාමාන්‍ය පොදු පරීක්ෂණය ඃ අයදුම්කරන්නේ නම් "Common General Test" ඉදිරියෙන් Yes යන්න තෝරා එයට අදාළ භාෂා මාධ්‍යය ද තෝරන්න.

4.5 **General English**
සාමාන්‍ය ඉංග්‍රීසි ඃ අයදුම් කරන්නේ නම් "General English" ඉදිරියෙන් Yes යන්න තෝරන්න.

4.6 විෂයන් තෝරා ගත් පසු අදාළ විෂයන් අයත් වන විෂය ධාරාව (Stream) ඔබට දර්ශනයවනු ඇත. ඒ පිළිබඳව ඔබගේ අවධානය යොමු කරන්න.

**ඊළඟ පියවරට යාමට Next අයිකනය භාවිත කරන්න.**

05. **Payment Methods**
විභාග ගාස්තු ගෙවීම තැපැල් කාර්යාල මගින් හෝ බැංකු කාඩ්පත් මගින් (online payment) මගින් සිදුකළ යුතුය.

5.1. තැපැල් කාර්යාල මගින් ගෙවීම් සිදු කරන්නේ නම් "Payment method" යටතේ ඇති "pay by post" අයිතමය තේරිය යුතුය. විභාග ගාස්තු ගෙවිය යුත්තේ **මුද්දරවලින්** හෝ **මුදල් ඇණවුම්**වලින් නොවේ. විභාග ගාස්තුව වශයෙන් නියමිත මුදල ළඟම ඇති ඕනෑම තැපැල්/උප තැපැල් කාර්යාලයකට ගෙවා කුවිතාන්සියක් ලබාගත යුතුය.

ලබාගත් කුවිතාන්සිය මුද්‍රණය කර ගත් අයදුම්පතේ අංක 14 යටතේ ඇලවිය යුතුයි. 2020 පෙබරවාරි 12 වැනි දින සිට 2020 මාර්තු 02 වන දින තෙක් දිවයිනේ සියලු ම තැපැල්/උප තැපැල් කාර්යාලවල මෙම කුවිතාන්සි නිකුත් කිරීම සඳහා විධිවිධාන යොදා ඇත.

5.2 බැංකු කාඩ්පත් (credit/debit cards) මගින් ගෙවීම සඳහා "Payment method" යටතේ ඇති "pay by credit/ debit card" අයිතමය තෝරා ගත යුතුය.

| විෂය ගණන | 1 | 2 | 3 | 4 | 5 |
|---|---|---|---|---|---|
| ගාස්තුව රුපියල් | 150/- | 200/- | 250/- | 350/- | 400/- |

අවසාන දිනට පෙර විභාග ගාස්තු ගෙවා තිබුණ ද අවසන් දිනයෙන් පසු එවනු ලබන අයදුම්පත් ප්‍රතික්ෂේප කිරීමට සිදුවන බව වැඩිදුරටත් දන්වමි.

**ගෘහ ආර්ථික විද්‍යාව, ඉංජිනේරු තාක්ෂණවේදය හා ජෛව පද්ධති තාක්ෂණවේදය යන විෂයන්ට පෙනී සිටින අයදුම්කරුවන් රු. 300/- බැගින් ප්‍රායෝගික පරීක්ෂණය සඳහා මීට අමතරව ගෙවිය යුතු ය. එම මුදල ප්‍රායෝගික පරීක්ෂණයට කැඳවනු ලැබූ විට පමණක් ගෙවිය යුතු අතර මේ සමඟ ගෙවීම් කිරීම අවශ්‍ය නොවේ.**

**ඊළඟ පියවරට යාමට Next අයිකනය භාවිත කරන්න.**

06. **Declaration of the applicant**
අයදුම්කරුගේ ප්‍රකාශය පිළිගැනීම සඳහා I agree මත Click කරන්න. අයදුම්පත මුද්‍රණය කර ගැනීම සඳහා Submit අයිකනය භාවිත කරන්න. මුද්‍රිත පිටපත විභාග දෙපාර්තමේන්තුව වෙත යොමු නොකරන ලද අයදුම්කරුවන් වෙත අපේක්ෂකත්වය ලබා නොදෙන බව අවධාරණය කරමි.

**07. ඇතුළත් කළ දත්ත සංශෝධනය කිරීම (Edit) -**
**7.1 ඔබ යම් වෙනස් කිරීමක් කරන්නේ නම් අයදුම්පත්‍රය "submit" කිරීමට පෙර කළ යුතුය.**
**7.2 අයදුම්පත "submit" කළ පසු කිසිදු අයුරකින් වෙනස් කළ නොහැක.**
**7.3 ඔබ විසින් මුද්‍රිත පිටපතෙහි ද කිසිදු වෙනස් කිරීමක් නොකළ යුතුය.**

08. **අයදුම්කරුගේ සහතිකය**
සුපරීක්ෂාකාරීව කියවා බලා මෙහි අයදුම්කරුගේ අත්සන යෙදිය යුතු ය.
අයදුම්පත්‍රය මුද්‍රණය කළ පසු අයදුම්කරුගේ සම්පූර්ණ නම සිංහල/දෙමළ මාධ්‍යයෙන් උප්පැන්න සහතිකයේ පරිදි අයදුම්කරු විසින්ම ලිවිය යුතුය.

උදාහරණ ඃ **කුලසූරියගේ මහේෂ් සුජිත් ද සිල්වා**

09. **හඳුනාගැනීමේ සහතිකය**
පෞද්ගලික අයදුම්කරුවන්ගේ අයදුම්පත්‍රයේ අත්සන සහතික කළ යුත්තේ, තමා පදිංචි ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ ග්‍රාම නිලධාරී විසින් පමණි. ඒ සඳහා ජාතික හැඳුනුම්පතේ හෝ වලංගු විදේශ ගමන් බලපත්‍රයේ හෝ වලංගු රියදුරු බලපත්‍රයේ හෝ ඡායා පිටපතක් රැගෙන යා යුතු ය.

U.U.A.6.3.2016.AL Paper AD

10. **අයදුම්පත් ප්‍රතික්ෂේප කිරීම ඃ**

1. පෞද්ගලික අයදුම්කරුවන් ලෙස ඉල්ලුම් කළ හැක්කේ පාසලෙන් අස්වී ඇති අයදුම්කරුවන්ට පමණි. පාසලේ ඉගෙනගනිමින් ම පෞද්ගලික අයදුම්කරුවන් ලෙස පෙනී සිටින අපේක්ෂකයින් විභාග තහනමකට ලක් කෙරෙනු ඇත.

2. නියමිත දිනට පසුව මුදල් ගෙවනු ලබන හෝ නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

3. පෞද්ගලික/ජාත්‍යන්තර පාසල්වල ලිපිනයන් පෞද්ගලික ලිපිනය ලෙස සඳහන් කර ඇති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

4. මුද්‍රිත පිටපත විභාග දෙපාර්තමේන්තුවට යොමු නොකරන ලද අයදුම්කරුවන්ගේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

# විෂය ලේඛනය

| විෂයය | විෂය අංකය | විෂය | විෂය අංකය |
|---|---|---|---|
| භෞතික විද්‍යාව | 01 | බෞද්ධ ශිෂ්ටාචාරය | 45 |
| රසායන විද්‍යාව | 02 | හින්දු ශිෂ්ටාචාරය | 46 |
| ගණිතය | 07 | ඉස්ලාම් ශිෂ්ටාචාරය | 47 |
| කෘෂි විද්‍යාව | 08 | ග්‍රීක හා රෝම ශිෂ්ටාචාරය | 48 |
| ජීව විද්‍යාව | 09 | ක්‍රිස්තියානි ශිෂ්ටාචාරය | 49 |
| සංයුක්ත ගණිතය | 10 | චිත්‍ර කලාව | 51 |
| උසස් ගණිතය | 11 | නර්තනය (දේශීය - උඩරට) | 52A |
| * සාමාන්‍ය පොදු පරීක්ෂණය | 12 | නර්තනය (දේශීය - පහතරට) | 52B |
| * සාමාන්‍ය ඉංග්‍රීසි | 13 | නර්තනය (දේශීය - සබරගමු) | 52C |
| සිවිල් තාක්ෂණවේදය | 14 | නර්තනය (භරත) | 53 |
| යාන්ත්‍රික තාක්ෂණවේදය | 15 | පෙරදිග සංගීතය | 54 |
| විදුලිය, ඉලෙක්ට්‍රොනික හා තොරතුරු තාක්ෂණවේදය | 16 | කර්ණාටක සංගීතය | 55 |
| | | බටහිර සංගීතය | 56 |
| ආහාර තාක්ෂණවේදය | 17 | නාට්‍ය හා රංග කලාව (සිංහල) | 57 |
| කෘෂි තාක්ෂණවේදය | 18 | නාට්‍ය හා රංග කලාව (දෙමළ) | 58 |
| ජෛව සම්පත් තාක්ෂණවේදය | 19 | නාට්‍ය හා රංග කලාව (ඉංග්‍රීසි) | 59 |
| තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය | 20 | ඉංජිනේරු තාක්ෂණවේදය | 65 |
| ආර්ථික විද්‍යාව | 21 | ජෛව පද්ධති තාක්ෂණවේදය | 66 |
| භූගෝල විද්‍යාව | 22 | තාක්ෂණවේදය සඳහා විද්‍යාව | 67 |
| දේශපාලන විද්‍යාව | 23 | | |
| තර්ක ශාස්ත්‍රය හා විද්‍යාත්මක ක්‍රමය | 24 | සිංහල | 71 |
| ඉන්දීය ඉතිහාසය | 25A | දෙමළ | 72 |
| යුරෝපා ඉතිහාසය | 25B | ඉංග්‍රීසි | 73 |
| නූතන ලෝක ඉතිහාසය | 25C | පාලි | 74 |
| ගෘහ ආර්ථික විද්‍යාව | 28 | සංස්කෘත | 75 |
| සන්නිවේදන හා මාධ්‍ය අධ්‍යයනය | 29 | අරාබි | 78 |
| ව්‍යාපාර සංඛ්‍යානය | 31 | මැලේ | 79 |
| ව්‍යාපාර අධ්‍යයනය | 32 | ප්‍රංශ | 81 |
| ගිණුම්කරණය | 33 | ජර්මන් | 82 |
| බුද්ධ ධර්මය | 41 | රුසියන් | 83 |
| හින්දු ධර්මය | 42 | හින්දි | 84 |
| ක්‍රිස්තියානි ධර්මය | 43 | චීන | 86 |
| ඉස්ලාම් | 44 | ජපන් | 87 |

U.U.A.6.3.2016.AL Paper AD

# අ.පො.ස.(උ.පෙළ) විභාගය - 2020
# විභාග මධ්‍යස්ථාන පිහිටුවන නගර

### කොළඹ දිස්ත්‍රික්කය

| නගරය | නගර අංකය |
|---|---|
| කොටහේන | 01 |
| මරදාන | 02 |
| බොරැල්ල | 03 |
| මාලිගාවත්ත | 04 |
| කොළොන්නාව | 05 |
| කුරුඳුවත්ත | 06 |
| බම්බලපිටිය | 07 |
| හැවුලොක්ටවුම | 08 |
| නුගේගොඩ | 09 |
| කෝට්ටේ | 10 |
| බත්තරමුල්ල | 11 |
| මොරටුව | 12 |
| පිළියන්දල | 13 |
| හෝමාගම | 14 |
| මහරගම | 15 |
| හංවැල්ල | 16 |
| අවිස්සාවේල්ල | 17 |

### ගම්පහ දිස්ත්‍රික්කය

| නගරය | නගර අංකය |
|---|---|
| මීගමුව | 26 |
| සීදුව | 27 |
| කොච්චිකඩේ | 28 |
| මිනුවන්ගොඩ | 29 |
| දිවුලපිටිය | 30 |
| වේයන්ගොඩ | 31 |
| මීරිගම | 32 |
| ගම්පහ | 33 |
| ගනේමුල්ල | 34 |
| නිට්ටඹුව | 35 |
| ජා-ඇල | 36 |
| වත්තල | 37 |
| රාගම | 38 |
| කැළණිය | 39 |
| මහර | 40 |
| දොම්පෙ | 41 |
| කිරිඳිවැල | 42 |

### කළුතර දිස්ත්‍රික්කය

| නගරය | නගර අංකය |
|---|---|
| හොරණ | 51 |
| බුලත්සිංහල | 52 |
| පානදුර | 53 |
| බණ්ඩාරගම | 54 |
| කළුතර | 55 |
| බේරුවල | 56 |
| මතුගම | 57 |
| අගලවත්ත | 58 |
| කඹුරාවල | 59 |
| අළුත්ගම | 60 |

### මාතලේ දිස්ත්‍රික්කය

| නගරය | නගර අංකය |
|---|---|
| මාතලේ | 71 |
| ගලේවෙල | 72 |
| නාඋල | 73 |
| ලග්ගල පල්ලේගම | 74 |
| දඹුල්ල | 75 |

### මහනුවර දිස්ත්‍රික්කය

| නගරය | නගර අංකය |
|---|---|
| මහනුවර | 81 |
| කඩුගන්නාව | 82 |
| දෙල්තොට | 83 |
| තලාතුඔය | 84 |
| පිළිමතලාව | 85 |
| කටුගස්තොට | 86 |
| තෙල්දෙණිය | 87 |
| වත්තේගම | 88 |
| උඩුදුම්බර | 89 |
| පූජාපිටිය | 90 |
| හසලක | 91 |
| නුගවෙල | 92 |
| ගලගෙදර | 93 |
| ගම්පොල | 94 |
| නාවලපිටිය | 95 |
| අලවතුගොඩ | 96 |
| අකුරණ | 97 |
| පේරාදෙණිය | 98 |

### නුවරඑළිය දිස්ත්‍රික්කය

| නගරය | නගර අංකය |
|---|---|
| හැඳුනුවැව | 101 |
| නුවරඑළිය | 102 |
| වතුමුල්ල | 103 |
| හැටන් | 104 |
| ගිනිගත්හේන | 105 |
| හඟුරන්කෙත | 106 |
| මස්කෙළිය | 107 |
| තලවකැලේ | 108 |
| කොත්මලේ | 109 |
| වලපනේ | 110 |

### ගාල්ල දිස්ත්‍රික්කය

| නගරය | නගර අංකය |
|---|---|
| අම්බලන්ගොඩ | 111 |
| බලපිටිය | 112 |
| කරන්දෙණිය | 113 |
| ගාල්ල | 114 |
| හබරාදූව | 115 |
| තවලම | 116 |
| බද්දේගම | 117 |
| ඇල්පිටිය | 118 |
| නාගොඩ | 119 |
| බෙන්තොට | 120 |
| ගිංතොට | 121 |
| අහංගම | 122 |
| උනවටුන | 123 |
| උඩුගම | 124 |

### මාතර දිස්ත්‍රික්කය

| නගරය | නගර අංකය |
|---|---|
| වැලිගම | 125 |
| මාතර | 126 |
| කඹුරුපිටිය | 127 |
| හක්මන | 128 |
| දෙයියන්දර | 129 |
| දෙවිනුවර | 130 |
| දික්වැල්ල | 131 |
| අකුරැස්ස | 132 |
| කොටපොල | 133 |
| දෙනියාය | 134 |

### හම්බන්තොට දිස්ත්‍රික්කය

| නගරය | නගර අංකය |
|---|---|
| බෙලිඅත්ත | 141 |
| ගැටමාන්න | 142 |
| වලස්මුල්ල | 143 |
| කටුවන | 144 |
| වීරකැටිය | 145 |
| තංගල්ල | 146 |
| නාකුළුගමුව | 147 |
| අම්බලන්තොට | 148 |
| අඟුණකොළපැලැස්ස | 149 |
| හුංගම | 150 |
| හම්බන්තොට | 151 |
| තිස්සමහරාමය | 152 |
| ලුණුගම්වෙහෙර | 153 |
| සූරියවැව | 154 |

### යාපනය දිස්ත්‍රික්කය

| නගරය | නගර අංකය |
|---|---|
| චාවකච්චේරිය | 161 |
| යාපනය | 162 |
| ඩෙල්ෆ්ට් | 163 |
| කෝපායි | 164 |
| කරවෙඩ්ඩි | 165 |
| තෙල්ලිප්පලෙයි | 166 |
| පේදුරුතුඩුව | 167 |

### කිලිනොච්චිය දිස්ත්‍රික්කය

| නගරය | නගර අංකය |
|---|---|
| කිලිනොච්චිය | 171 |
| පලෙයි | 172 |

### මන්නාරම් දිස්ත්‍රික්කය

| නගරය | නගර අංකය |
|---|---|
| මන්නාරම | 176 |
| මුරුන්කන් | 177 |
| මඩු | 178 |

### මුලතිව් දිස්ත්‍රික්කය

| නගරය | නගර අංකය |
|---|---|
| මුලතිව් | 186 |
| මුල්ලියාවලෙයි | 187 |
| පුතුකුඩිඉරුප්පු | 188 |
| මල්ලාවි | 189 |
| යෝගපුරම් | 190 |

### වව්නියාව දිස්ත්‍රික්කය

| නගරය | නගර අංකය |
|---|---|
| වවුනියාව | 196 |
| ඕමන්තෙයි | 197 |

### ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය

| නගරය | නගර අංකය |
|---|---|
| කන්තලේ | 206 |
| ත්‍රිකුණාමලය | 207 |
| මුත්තූර් | 208 |
| කින්නියා | 209 |
| පුල්මුඩේ | 210 |

### මඩකලපුව දිස්ත්‍රික්කය

| නගරය | නගර අංකය |
|---|---|
| මඩකලපුව | 216 |
| එරාවූර් | 217 |
| කාත්තන්කුඩි | 218 |
| වාලච්චනෙයි | 219 |
| කලුවංචිකුඩි | 220 |
| චෙන්කලඩි | 221 |
| ඔට්ටමාවඩි | 222 |

**අම්පාර දිස්ත්‍රික්කය**

| නගරය | නගර අංකය |
|---|---|
| අම්පාර | 231 |
| දමන | 232 |
| උහන | 233 |
| දෙහිඅත්තකණ්ඩිය | 234 |
| සේරංකඩ | 235 |
| පොතුවිල් | 236 |
| කල්මුණේ | 237 |
| අක්කරෙයිපත්තු | 238 |
| සම්මන්තුරෙයි | 239 |
| නින්දවූර් | 240 |
| තිරුක්කෝවිල් | 241 |

**පුත්තලම් දිස්ත්‍රික්කය**

| නගරය | නගර අංකය |
|---|---|
| වෙන්නප්පුව | 251 |
| දංකොටුව | 252 |
| මාදම්පේ | 253 |
| හලාවත | 254 |
| මාරවිල | 255 |
| නාත්තන්ඩිය | 256 |
| පුත්තලම | 257 |
| මුන්දලම | 258 |
| ආණමඩුව | 259 |
| කල්පිටිය | 260 |

**කුරුණෑගල දිස්ත්‍රික්කය**

| නගරය | නගර අංකය |
|---|---|
| කුලියාපිටිය | 266 |
| බිංගිරිය | 267 |
| හෙට්ටිපොල | 268 |
| පන්නල | 269 |
| නාරම්මල | 270 |
| ගිරිඋල්ල | 271 |
| පොල්ගහවෙල | 272 |
| කුරුණෑගල | 273 |
| ඉබ්බාගමුව | 274 |
| දොඩන්ගස්ලන්ද | 275 |
| මොරතිහ | 276 |
| මාවතගම | 277 |
| වාරියපොල | 278 |
| නිකවැරටිය | 279 |
| කොබෙයිගනේ | 280 |
| මහව | 281 |
| ගල්ගමුව | 282 |
| අලව්ව | 283 |

**අනුරාධපුරය දිස්ත්‍රික්කය**

| නගරය | නගර අංකය |
|---|---|
| මැදවච්චිය | 291 |
| පදවි පරාක්‍රමපුර | 292 |
| කැකිරාව | 293 |
| ගල්නෑව | 294 |
| අනුරාධපුරය | 295 |
| ගලෙන්බිඳුනුවැව | 296 |
| කහටගස්දිගිලිය | 297 |
| නොච්චියාගම | 298 |
| තඹුත්තේගම | 299 |
| කැඹිතිගොල්ලෑව | 300 |
| රඹෑව | 301 |
| මිහින්තලය | 302 |
| හොරොව්පතාන | 303 |
| පදවිය | 304 |

**පොළොන්නරුව දිස්ත්‍රික්කය**

| නගරය | නගර අංකය |
|---|---|
| පොළොන්නරුව | 306 |
| හිඟුරක්ගොඩ | 307 |
| මනම්පිටිය | 308 |
| බකමූණ | 309 |
| මැදිරිගිරිය | 310 |
| ගිරිතලේ | 311 |

**බදුල්ල දිස්ත්‍රික්කය**

| නගරය | නගර අංකය |
|---|---|
| බණ්ඩාරවෙල | 316 |
| හල්දුම්මුල්ල | 317 |
| වැලිමඩ | 318 |
| බදුල්ල | 319 |
| පස්සර | 320 |
| මහියංගනය | 321 |
| ගිරාදුරුකෝට්ටේ | 322 |
| හාලිඇල | 323 |
| අඹගස්දෝව | 324 |

**මොණරාගල දිස්ත්‍රික්කය**

| නගරය | නගර අංකය |
|---|---|
| බිබිල | 331 |
| මොණරාගල | 332 |
| වැල්ලවාය | 333 |
| බඩල්කුඹුර | 334 |
| බුත්තල | 335 |

**කෑගල්ල දිස්ත්‍රික්කය**

| නගරය | නගර අංකය |
|---|---|
| කෑගල්ල | 341 |
| දැරණියගල | 342 |
| දෙහිඕවිට | 343 |
| රඹුක්කන | 344 |
| මාවනැල්ල | 345 |
| වරකාපොල | 346 |
| හෙම්මාතගම | 347 |
| අරණායක | 348 |
| රුවන්වැල්ල | 349 |
| යටියන්තොට | 350 |

**රත්නපුර දිස්ත්‍රික්කය**

| නගරය | නගර අංකය |
|---|---|
| ඇහැලියගොඩ | 356 |
| රත්නපුර | 357 |
| පැල්මඩුල්ල | 358 |
| ගොඩකවෙල | 359 |
| බලංගොඩ | 360 |
| කලවාන | 361 |
| නිවිතිගල | 362 |
| ඇඹිලිපිටිය | 363 |